42453

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

21 S I,II

දෙවන වාර පරීක්ෂණය, 2018 ජූලි
Second Term Test, July 2018

10 ශ්‍රේණිය
Grade 10

සිංහල භාෂාව හා සාහිත්‍යය - I,II
Sinhala language and literature - I,II

පැය තුනයි
Three hours

## සිංහල භාෂාව හා සාහිත්‍යය - I

**සැලකිය යුතුයි :**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.**
- **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**

- **අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න**

(01) සමහර විචාරකයෝ නිර්මාණකරුවන් ගොනාට අන්දවති.
1. විහිළුවට ලක් කරති.
2. පැසසුමට කැමති වෙති.
3. දැඩි විවේචනයට පත් කරති.
4. මුළා කිරීමට යත්න දරති.

(02) ගැටලුවක් පැමිණි සෑම අවස්ථාවක දී ම ජයතුංග ලිස්සා යෑමට වග බලා ගනියි.
1. මග හැර යෑමට
2. විවිධ උපක්‍රම යෙදීමට
3. කිසිවෙකුට නොදන්වා යෑමට
4. අන්‍යයන් නොසලකා හැරීමට

(03) ආයතනයේ ඇති වූ තත්වයත් සමඟ ඇතැමෙක් කල දුටු කල වළ ඉහ ගැනීමට පෙළඹුණහ.
1. තත්වය වඩාත් අවුල් කිරීම.
2. අන්‍යයන්ට උපකාරී වීම.
3. අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීම.
4. එකිනෙකා භේද කිරීම.

- **අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

(04) ජනශ්‍රැති ආරක්‍ෂා කිරීමේ ප්‍රධාන අරමුණ වනුයේ දේශීය සංස්කෘතියේ.......................................... රැකගැනීමයි.
1. සම්ප්‍රාප්තිය 2. අවශ්‍යතාව 3. අනන්‍යතාව 4. දෘශ්‍යතාව

(05) තමන්ගේ ශ්‍රමයට සරිලන වැටුපක් නොලැබෙයි. සේවිකාවෝ.......................................... නගති.
1. මැසිවිලි 2. ඇවිටිලි 3. සිතිවිලි 4. ඇඟවිලි

(06) නිදහස් අධ්‍යාපනයේ.......................................... වඩාත් ලැබුණේ ග්‍රාමීය සිසුන්ට බව සැමදෙනා පිළිගන්නා කරුණකි.
1. ප්‍රති අවස්ථා 2. ප්‍රතිලාභ 3. ප්‍රතිසංවිධාන 4. ප්‍රතිග්‍රහණ

(07) අකාරාදී පිළිවෙළ නිවැරදිව දක්වෙන පද පේළිය තෝරන්න.
1. හංස සන්දේශය, අමාවතුර, දළදා සිරිත, පූජාවලිය
2. ගිරා සංදේශය, බුත්සරණ, බුදුගුණාලංකාරය, සඳකිඳුරුදාකව
3. මඩොල් දූව, විජයබා කොල්ලය, රන්මුතුදූව, ගම්පෙරළිය
4. කාව්‍යශේඛරය, බෝධිවංශය, ජාතකපොත, ධර්මප්‍රදීපිකාව

Remove Watermark Now

(08) සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.

1. ශිෂ්ටාචාරය, ප්‍රවෘත්තිය, සම්ප්‍රදාය, දුෂ්ඨිය
2. ඖෂධාලය, තූර්යවාදනය, සෞන්දර්ය්‍ය, ලේඛම්.
3. මර්ධනය, සට්ටනය, ඓක්‍යය, වාර්තාව
4. මද්‍යසාරය, කෘත්‍රිම, ප්‍රස්තාරය, පරිගණකය

(09) එක් එක් වචනවල මුලකුරෙහි ඇදය, දීර්ඝ පාපිල්ල, ඉස්පිල්ල සහ ඇලපිල්ල යෙදුණු වරණය වන්නේ,

1. කැත්ත, කුල්ල, මීටිය, කාලය     2. වැලි, නූල, ගිරය, පාලම
3. දෙබල, මල්ල, දූපත, වැට     4. ගෙදර, රූපය, මීකිරි, මාලය

(10) ඝෝෂ අක්ෂරයක්, සඤ්ඤක අක්ෂරයක්, ඌෂ්මාක්ෂරයක්, අඝෝෂ අක්ෂරයක් පිළිවෙළින් යෙදුණු වරණය තෝරන්න.

1. ඨ, න, ඡ, ෆ     2. ට, ම, හ, ඳ     3. ධ, ඟ, ශ, ප     4. ක, ඬ, ස, ළ

(11) මහගමසේකර, ආරියවංශ රණවීර, ගුණදාස අමරසේකර, ඩබ්. ඒ. සිල්වා යන කතුවරුන් විසින් රචිත කෘති පිළිවෙළින් යෙදී ඇති වරණය වන්නේ,

1. සුනේත්‍රා, බෝඩිම, රන්රෝස, ආවර්ජනා     2. රන්රෝස, සුනේත්‍රා, බෝඩිම, ආවර්ජනා
3. බෝඩිම, රන්රෝස, ආවර්ජනා, සුනේත්‍රා     4. ආවර්ජනා, බෝඩිම, සුනේත්‍රා, රන්රෝස

(12) පිපුණු මලේ රුව - එ මල දනී දෝ
**මලකි දුවේ නුඹ** - හැඩ රුව බලන්නෙපා...... තද කළු අකුරෙන් මුද්‍රිත පද්‍ය පාදය,

1. රූපකයකි     2. උපමාවකි     3. සමාසයකි     4. විභක්තියකි

(13) ''හාරයි'' යන ක්‍රියාපදයේ උත්තම පුරුෂ බහුවචන අතීත කාල රූපය ඇතුළත් වරණය වන්නේ,

1. හාරන්නෙමි.     2. හාරවන්නෙමු     3. හෑරීමි     4. හෑරුවෙමු

(14) ''නටති'' යනු,

1. ප්‍රථම පුරුෂ, බහු වචන, කර්මකාරක, වර්තමාන කාල පදයකි.
2. උත්තම පුරුෂ, බහු වචන, කර්මකාරක, වර්තමාන කාල ක්‍රියා පදයකි.
3. මධ්‍යම පුරුෂ, ඒක වචන, භාව කාරක, වර්තමාන කාල ක්‍රියා පදයකි.
4. ප්‍රථම පුරුෂ බහුවචන, කර්තෘකාරක වර්තමාන කාල ක්‍රියා පදයකි.

(15) උක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

1. තොප, මම, ගැහැණියක්, ඕ     2. අපි, කෙනෙක්, ඇතැම්හු, ගුරුවරු
3. පූජකයෝ, සතෙකු, දූරියක, තෝ     4. මිනිසුන්, මා, නුඹ, ඔවුන්

(16) ප්‍රාදේශීය ව්‍යවහාරයන්ගේ අර්ථය වැරදි ලෙස යෙදුණු වරණය වන්නේ,

1. කුදහව්වා - කුදලාගෙන, පුන්නච්චා - පැන්නුවා
2. ගහමච්චා - විසිකළා, කොකිස් - කිරිඅල
3. පුහුල් - වට්ටක්කා, අඹ - ගස්ලබු
4. සකලයා - කුරුල්ලා, ඔයනවා - ලෙලිගහනවා

(17) ''ඊය'' යන තද්ධිත ප්‍රත්‍යයෙන් ප්‍රකාශිත අර්ථය තෝරන්න.

1. ස්වල්පාර්ථය     2. සමූහාර්ථය     3. භාවාර්ථය     4. එයට අයත්

(18) විරුද්ධාර්ථවත් පද යුගලයක් නොවන්නේ කුමක්ද?

1. උතුම් - පවර     2. ආකර්ෂණ - විකර්ෂණ
3. ප්‍රපාතය - මස්තකය     4. ශිථිල - දෘඪ

papers.lk
pdfelement

Remove Watermark Now

(19) වැරදි ලෙස යෙදී ඇති තනිපදයක් ඇතුළත් වරණය තෝරන්න.

1. පහ වූ රාග ක්ලේශ ඇති - වීතරාගී
2. තල්ල මුදුන ඇසුරින් උපන් - ඕෂ්ඨජ
3. බොහෝ සේ කතා කරන - මුඛරි
4. තමා උසස් කොට සැලකීම - අත්තුක්කංසනය

(20) දුව හොරුන් විසින් කැපෙන ගස් රාජසන්තක විය. තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් වියරණ වර්ගය පිළිවෙළින්,

1. නිපාත, පූර්ව ක්‍රියා
2. නිපාත, තද්ධිත
3. නිපාත, කෘදන්ත
4. නිපාත, මිශ්‍ර ක්‍රියා

(21) පහත අක්ෂර ගැළපීමෙන් සූචනය වන නිවැරදි ග්‍රාමනාමය ඇතුළත් වරණය වනුයේ,

1. ධ ජ ත ර් ව ය පු ය ර
2. ම ක ර ද ත් ස ව ල
3. ච ශො කැ ති ල් බි ලැ
4. රා ධා නි අ පූ ය ර

(22) විරාම ලකුණු නිවැරදිව යෙදුණු වාක්‍ය තෝරන්න.

1. "මට අඳුනන්නත් බැරුව ගියා. හරියට ඇදිල ගිහිං"?
2. හැබෑට! ෂා මට වැරදිලා! දැන්නම් කරන්න දෙයක් නෑ?
3. ආයුබෝවන්! අද අපේ පාඩම "සිංහල වර්ණමාලාව"
4. "උඹලා ඔතන මොකද? කව්ද? උඹලාට ඔය තොරොක්කෝව අල්ලන්න කිව්වේ"!

(23) වැරදි ප්‍රකාශය තෝරන්න.

1. කිසියම් ප්‍රාර්ථනාවක් හැඟවෙන ක්‍රියා ආශිර්වාද ක්‍රියා වේ.
2. අවසාන ක්‍රියාවට පෙර සිදු කළ ක්‍රියා මිශ්‍ර ක්‍රියා වේ.
3. වෙනත් අයෙකු ලවා කරවන ක්‍රියා ප්‍රයෝජ්‍ය ක්‍රියා වේ.
4. වෙනත් අයෙකුට කරන විධානයක් හැඟවෙන ක්‍රියා විධි ක්‍රියා නම් වේ.

(24) මුලින් දී ඇති පදයට සමානාර්ථ පදයක් ඇතුළත් නොවන පද පේළිය තෝරන්න.

1. සයුර - ජලනිධි, සාගරය, සමුද්‍රය, නුබ ගඟ
2. චන්ද්‍රයා - සඳ, නිසයුරු, උළිඳු, සිසි
3. ශක්‍රයා - සක්, සහසැස්, දෙව්රජ, වජ්‍රපානි
4. සතුට - සොම්නස, ප්‍රමෝදය, ප්‍රහර්ෂය, ආනන්දය

(25) පහත දී ඇති කවියේ හිස්තැන පිරවීම සඳහා සුදුසු කවි පදය තෝරන්න.

බඩ වක පිට වක සත් වැරටිල්ලා
දෙපටට කුදු ගැසි වකට කුදුල්ලා
ඉසකේ පුපුරටි දත් කඩ තොල්ලා
..............................................................

1. මූණ රවාගෙන ගොස් ගෙට වැදිලා
2. බාන ලෙසට අල්ලා ගෙන රැවුලා
3. සොඳේ විඳින සැප විඳුමට මෙකලා
4. තිගෙ සැමි බමුණා කුණු කෙළ තොල්ලා

(26) නිත්‍ය බහුවචන පදයක් හා ක්‍රියා විශේෂණයක් ඇතුළත් වන වාක්‍ය තෝරන්න.

1. සමහරෙක් ගඟට බැස සතුටින් දිය නාති.
2. කෙනෙක් නිල් අහස දෙස බලා සිටිති.
3. අයෙක් රතු මල් පැලඳගෙන නටති.
4. ඇතැමෙක් බස් නැවතුම්පළට යති.

papers.lk
pdfelement

- අංක 27, 28 යටතේ දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

(27) ''පිහිටක් පතා ගිය තැනින් විපතක් සිදුවීම''

1. අලි මදිවට හරක්
2. එපා වාහෙට හොඳි බෙදන්නා වාගේ
3. කබලෙන් ලිපට වැටුණා වාගේ
4. වඳින්න ගිය දේවාලේ ඉහේ කඩා වැටුණා වාගේ

(28) ''ප්‍රයෝජනයට නැති දෙයක්'' යන්නට සුදුසු ප්‍රස්තාව පිරුළ වන්නේ,

1. මඬේ හිට වූ ඉන්න වගෙයි.
2. බක තපස් රැකීම.
3. පිඹුරු දඩයම වගෙයි.
4. බැද්දට පැයූ හඳ වගෙයි.

(29) ''දායකයෝ ස්වාමීන් වහන්සේ දනට වඩම්මවා ගෙන ගියෝය.'' මෙය නිවැරදි කර්මකාරක වාක්‍යයක් ලෙස දැක්වෙන වරණය වන්නේ,

1. දායකයන් විසින් ස්වාමීන් වහන්සේ දනට වඩම්මවා ගෙන යන ලද්දේ ය.
2. දායකයන් විසින් ස්වාමීන් වහන්සේ දනට වඩම්මවා ගෙන යන ලදී.
3. දායකයන් විසින් ස්වාමීන් වහන්සේ දනට වඩම්මවා ගෙන යන ලද සේක.
4. දායකයන් විසින් ස්වාමීන් වහන්සේ දනට වඩම්මවා ගෙන යන සේක.

(30) A - ලක්බිම වන සැරිය - මනෝ ප්‍රනාන්දු
B - මාගමක් - ස්ත්‍රියක්
C - පරිණාමවාදය - සම්භවය
D - සනුහරේ - පරම්පරාව

A, B, C, D, යෙදුම් අතරින් නිවැරදි යුගල වන්නේ,

1. A හා B පමණි 2. A සහ C පමණි 3. A C හා D පමණි 4. A B හා D පමණි

(31) ''ළමයා කෑම එපා කියමින් කෑගැසුවා''
ඉහත වාක්‍ය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වරණය වන්නේ,

1. ළමයා ආහාර ප්‍රතික්ෂේප කර කෑගැසුවේ ය.
2. ළමයා ආහාර ප්‍රතික්ෂේප කරන කෑගැසුවේ ය.
3. ළමයා ආහාර ප්‍රතික්ෂේප කරමින් කෑගැසුවේ ය.
4. ළමයා ආහාර ප්‍රතික්ෂේප කිරීම නිසා කෑගැසුවේ ය.

(32) ''මේ තඩුකාරයාට එහෙම <u>**අහුණොත්**</u> ඔහොම දේවල් කියනවා, අපට හොඳට හිටින්නේ නෑ ඒක'' ඉරි ගසා ඇති පදය අයත් වන ක්‍රියා වර්ගය වන්නේ,

1. කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා
2. පූර්ව ක්‍රියා
3. මිශ්‍ර ක්‍රියා
4. අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා

(33) A - සෙංකඩගලපුර.......... මහනුවර පරිසර දූෂණය ඉහළ ගොස් ඇත.
B - ඔහු යහළුවන්ට.... එය නොදන්වී ය.
C - ....... එම් සොඳුර, එතෙක් ඉන්න.
D - අපි...... ගමන් ඇරඹීමු.

E - නැවත F - පවා G - හෙවත් H - නොලසා

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක්ද?

1. E , F , G , H 2. E , G , H , F 3. G , F , E , H 4. G , F , H , E

(34) මහාචාර්ය සරච්චන්ද්‍රයන් විසින් නිෂ්පාදනය කරන ලද නාට්‍යයක් නොවන්නේ,

1. ලෝම හංස 2. රත්තරන් 3. නරිබෑණා 4. මහාසාර

Remove Watermark Now

(35) පහත දැක්වෙන කවි පදවල උපමාවක් යෙදී නැති කවි පද තෝරන්න.

1. හැම ගනඳුරු බොන වර නිසයුරා ගත
2. නුබ කැට තෙලෙහි දිසි මෙන් තුරු පහන් වත
3. කෙළන රුසිරි රනෝවිලි වන
4. ඉතිර වෙරළ දිව යන මෙන් රළ පතර

(36) කාව්‍ය නිර්මාණයක විශිෂ්ටත්වය සඳහා **ව්‍යුත්පත්තිය** බලපායි. තද කළු අකුරින් මුද්‍රිත පදයේ අර්ථය වන්නේ,

1. නිතර පුහුණු කිරීමෙන් ලද ගුණය
2. පෙර නොඇසූ නොකී දේ නිර්මාණය කිරීමේ හැකියාව
3. ජීවන තක්සලාවෙන් ලබන පරිණත බුද්ධිය හා බහුශ්‍රැත බව
4. තේමාවට අදාළ නිර්මාණ සැකසීම.

- **අංක 37 - 38 දක්වා එක් එක් ප්‍රශ්නයෙහි දී ඇති වාක්‍ය අතුරෙන් ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.**

(37)
1. අයෙක් අප ගැන වරදවා සිතයි.
2. විශාඛාව යහපත් මවක් ද වූහ.
3. මේ ප්‍රදේශයේ සිටි සත්තු කෝ?
4. දරුවන් විදේශ ගත වූහ'යි මව ශෝකයට පත්වූහ.

(38)
1. සියලු මිනිසුන් සත්‍ය ගරුක විය යුත්තෝ ය.
2. මම එය කියවා ඇත.
3. තෙපි සත්‍යගරුක විය යුත්තෙහි.
4. අපි නීතිගරුක පුරවැසියෝ වෙමු.

(39) ආදි මානවයාගේ සිට නූතන මානවයා තෙක් පැමිණීම පිළිබඳව චාල්ස්ඩාවින්ගේ මතය ප්‍රබල වූවකි. "ආදි මානවයාගේ සිට නූතන මානවයා තෙක් පැමිණීම" යන්න වෙනුවට යෙදිය හැකි වඩාත් යෝග්‍ය පදය කුමක්ද?

1. සම්භවය
2. පුනර්ජීවනය
3. විප්ලවය
4. පරිණාමය

- **මුලින් ඉදිරිපත් කර ඇති පාඨය සඳහා වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.**

(40) අපේ මුල් කතාකරුවන් මට සිලිටු බස්වහරක් යොදා නොගත්තත්, ව්‍යවහාරයට සමීප වූ සුබනම්‍ය වූ භාෂාවක් යොදා ගැනීමට පෙළඹුණු පශ්චාත් කාලීන ව්‍යක්ත ලේඛකයෝ වාක්‍ය රීති විකෘති නොකරති.

1. මුල් අවධියේ පොත්පත් දක්නට ඇත්තේ කන්කලු බස් වහරකි.
2. නූතන සාහිත්‍ය ලේඛකයන් අනුගමනය කරන්නේ පැරණි වාග් රීතියයි.
3. ව්‍යවහාරික භාෂා රටා අගයන නූතන ලේඛකයෝ වාක්‍ය රීති උල්ලංඝනය නොකරති.
4. වර්තමාන ලේඛකයන් ප්‍රියකරන්නේ චිරන්තන වාක්‍ය රීතිය මැ'යි.

Remove Watermark Now
pdfelement
papers.lk

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

21 | S | I,II

42785

දෙවන වාර පරීක්ෂණය, 2018 ජුලි
Second Term Test, July 2018

10 ශ්‍රේණිය
Grade 10

සිංහල භාෂාව හා සාහිත්‍යය - I, II
Sinhala language and literature - I, II

## සිංහල භාෂාව හා සාහිත්‍යය - II

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.**

**(01) (i) - (x) දක්වා ඇති සියලු ම අනු කොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

i) සිංහල අක්ෂර මාලාවෙහි
   (අ) වර්ගාන්ත අක්ෂර දෙකක් ද,

   (ආ) ඝෝෂ අක්ෂර දෙකක් ද ලියා දක්වන්න.

ii) පහත සඳහන් වාක්‍යයේ පද දෙක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම පද දෙක නිවැරදි කර ලියන්න.
"මිහිදු හිමියන්ගේ දීර්ගකාලීන කැපවීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් අප රටට සිදු වූ සේවය විශිෂ්ඨ සම්පතකැයි විවාදයෙන් තොරව පිළිගත යුතු ය."

iii) පහත දැක්වෙන ක්‍රියා පදවල ධාතු ප්‍රකෘති වෙන් කර ලියන්න.
   (අ) ලියති

   (ආ) හැඬූහ

iv) පහත සඳහන් (අ) හා (ආ) හි දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.
   (අ) ගී ද මෝපසං ප්‍රංශයේ විසූ කෘතහස්ත ලේඛකයකු වූයේ ය.

   (ආ) මහවැලි ගංගා තොමෝ කෙත් වතු සරු කරමින් ගලා බසිති.

v) පහත සඳහන් පදවල විරුද්ධාර්ථ පද ලියන්න.
   (අ) සුසිරිත

   (ආ) දුර්ලභ

vi) පහත සඳහන් කවි පදවල තද කළු අකුරින් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය නම් කරන්න.
   මූණ රවා ගෙන **ගොස්** ගෙට වැදිලා

   පූන නූල ඇද **දමමින්** බිඳලා

vii) පහත සඳහන් (අ), (ආ) යටතේ දැක්වෙන අදහස්වලට තනි පදය බැගින් ලියන්න.
   (අ) කිසිවෙකුටත් නොදෙවෙති -

   (ආ) අසා රස විඳීමේ අරමුණෙන් ලියන ලද -

viii) පහත සඳහන් කර්මකාරක වාක්‍ය කර්තෘකාරකයට හරවා ලියන්න.
   (අ) විදුහල්පතිතුමන් විසින් උදෑසන රැස්වීමේ දී අපි අමතනු ලද්දෙමු.

   (ආ) ගොවියන් විසින් කමතේ දී මී හරක් මෙහෙයවනු ලබති.

ix) පහත සඳහන් පද යොදා අර්ථවත් වාක්‍ය බැගින් ලියන්න.
   (අ) ආකර්ෂණීය

   (ආ) පරාර්ථකාමී

x) කෘෂිකාර්මික ජීවිතයට හා බැඳුණු පහත සඳහන් වචනවල තේරුම පොදු ව්‍යවහාර භාෂාවෙන් ලියන්න.
   (අ) මුත්තෙට්ටුව

   (ආ) සේරංගාව

(ලකුණු.2 x 10 = 20යි)

Remove Watermark Now

(02) **පහත දැක්වෙන අ, ආ, ඉ, ඊ යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250ට නොඅඩු වන සේ රචනයක් ලියන්න. රචනය සඳහා සුදුසු මාතෘකාවක් ද යොදන්න.**

(අ) සංගීතය විශ්ව භාෂාවකි. එය මිනිස් හදවත් සුවපත් කරයි. වචන නැතිව ද නාද රටාවෙන් පවා රසිකයා පිනවයි. එහෙත් වත්මන් මාධ්‍යවලින් නිතර ඇසෙන ගීතවලින් එම උසස් පරමාර්ථය ඉටු නොවේ. වේග රිද්ම සංගීතය, හරසුන් පදවැල් නිසා සැබෑ රසයක් ශ්‍රාවකයාට නොලැබේ. හරවත් ගීත සම්ප්‍රදායක අවශ්‍යතාව දැන් දැඩිව දැනේ.

(ආ) කෘෂිකර්මය හා කර්මාන්ත පදනම් කරගත් වැඩ පිළිවෙළක් මගින් අපේ රටේ ආර්ථික, සාමාජික හා සංස්කෘතික සංවර්ධනය ඇති කිරීමේ යෝධ ව්‍යාපෘති ගණනාවක් දැන් ක්‍රියාත්මක වේ. මේ සංවර්ධන කාර්යයට තම ශක්ති ප්‍රමාණයෙන් හවුල් වීම හැමකෙනෙකුගේ ම වගකීම වන්නේ ය. පාසල් දරුවන් වශයෙන් ඔබට ද මෙහි ලා පැවරී ඇති වගකීම සුවිසල් ය.

(ඉ) සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමාගේ පුරෝගාමීත්වයෙන් මෙරට බිහි වූ නිදහස් අධ්‍යාපනයේ මූලික අරමුණ වූයේ රජයේ පරිපාලනයට යටත් වූ පොදු අධ්‍යාපන ක්‍රමයක් පිහිටුවා ගැනීම ය.එමගින් නිදහස් අධ්‍යාපනයේ දොරටු සියලු දෙනාට ම විවෘත විය. පළමු ශ්‍රේණියේ සිට විශ්ව විද්‍යාල තෙක් නිදහස් අධ්‍යාපනය හිමි විය. අද වන විට නොමිලේ නිල ඇඳුම්, පෙළපොත් හා ආහාර පාසල් දරුවන්ට හිමි වේ. එහෙත් ජාත්‍යන්තර පාසල් හා උපකාරක පංති ව්‍යාප්ත වීම දක්නට ඇත.

(ඊ) "කියවීමෙන් මිනිසා සම්පූර්ණ වේ." යන්න ජනප්‍රිය යෙදුමකි. එහෙත් වත්මන් විද්‍යාත්මක ලෝකයේ තොරතුරු තාක්ෂණ මෙවලම් තුළින් ඉක්මනින් ලබා ගත හැකි බව පැවසේ. එම තොරතුරු පුද්ගලයාගේ ආකල්ප සංවර්ධනයට කෙතෙක් දුරට ඉවහල් වේ ද යන්න සිතා බැලිය යුතුය. අද කියවීම සමාජයෙන් ඈත් වීමට විවිධ හේතු බලපා ඇත. කියවීම වඩා අර්ථපූර්ණ වීමෙන් පුද්ගල ආකල්ප සංවර්ධනය නංවාලිය හැකිය. (ලකුණු 25යි)

**(03) පහත දැක්වෙන පාඨය වචන 50 - 55 අතර ගණනකින් යුක්ත වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.**

ආර්ථික සංවර්ධනයක් යැයි කියාපාමින් අනවසර ඉදිකිරීම්, පහත් බිම් ගොඩකිරීම්, රටට වරෙත්තු නොදෙන මාහාමාර්ග ඉදිකිරීම්, කඳු කපා මාර්ග පළල් කිරීම්, වැලි ගොඩ දැමීම්, තැන නොතැන නොබලා කර්මාන්තශාලා ඉදිකිරීම්, ගංගා ආශ්‍රිත ප්‍රදේශවල ආරක්ෂිත භූමි විනාශ කිරීම්, වනාන්තර කැපීම් කරමින්, මැණික් ගැරීම්, බොරලු කැපීම්, කිරි මැටි කැපීම් හා වෙනත් විවිධ අවශ්‍යතා සඳහා ක්‍රමවේදවලින් තොර ව කළ ක්‍රියා නිසා සිදු වූ ඛේදවාචක පසුගිය දිනවල අපි අත්වින්දෙමු. මෙම ක්‍රියාවලින් නිසා පාංශු ඛාදනය, පාංශුවල ගුණාත්මක බව නැතිවීම, නායයාමේ ගංවතුර, පහත් බිම් ක්ෂණයකින් යටවීම් ජල උල්පත් සිඳීම් ආදිය සිදුවිය. ඊට අමතරව ප්ලාස්ටික් පොලිතින් පිළිස්සීම මගින් ඇතිවන විෂ වායුව වායු ගෝලයට එක්වීමෙන් ඕසෝන් ස්ථරයට හානි වී පෘථිවි උෂ්ණත්වය ඉහළයාම ආදිය සිදු වී දරාගත නොහැකි උෂ්ණත්වයකට මුළු ලොවෙහිම මානවයාට මුහුණපෑමට වර්තමානය වන විට සිදු වී ඇත. ලෝකයේ බිලියන හතක් වූ ජනගහනයෙන් මිලියන දෙසිය විසි දෙකක් තම ආහාර අවශ්‍යතා සපුරාගන්නේ වනාන්තර මුල්කොටගෙන ය. වන විනාශය නිසා සිදුවන විනාශය සුළු පටු නොවේ. කර්මාන්තශාලාවලින් පිටකරන විෂ ජලයට මුසුවීමෙන් ජල ගෝලය, දූෂිත වෙමින් පවතී. වාර්ෂිකව ශ්‍රී ලංකාවේ ටොන් බිලියන අටක ප්ලාස්ටික් ප්‍රමාණයක් සාගරයට මුදා හරී.

(ලකුණු 10යි)

(04) **පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

ශාස්ත්‍රාලයීය චිත්‍ර සම්ප්‍රදායේ දී හැමවිට ම සිදු වූයේ ස්වභාවික පරිමාණය එලෙසින් ම නිරූපණය කිරීමයි. පෙරදිග සම්ප්‍රදායේ දී අනුගමනය කළේ ස්වභාවික පරිමාණය නොව අන්තර්ඥානීය පරිමාණයි. මහනුවර යුගයේ චිත්‍රකලා සම්ප්‍රදාය අනුව කරන ලද සිත්තම් දුර්වල කලා ලක්ෂණයන්ගෙන් හෙබි කෘතීන් ලෙස යුරෝපීය ආකල්පයන්ගෙන් හිස පුරවා ගත් ඇතැමෙකු විසින් හඳුන්වනු ලැබී ය. එය කොතරම් දුරට සාධාරණ විනිශ්චයක් දැයි අප විසින් සිතා බැලිය යුතුය. මහනුවර යුගයේ සිත්තම්හි පර්යාලෝකය පිළිබඳ කිසිදු අවධානයක් යොමු කර නැතිවීම එක දුර්වල ලක්ෂණයක් ලෙස ඇතැමෙක් පෙන්වා දෙති දඹුලු විහාරයේ සිත්තම් කීපයකත් රත්නපුර කෝට්ටිඹුල්වල විහාරයෙත් යුරෝපීය ක්‍රමයේ පර්යාලෝකනය දක්වා ඇතත් එය ජනතාව තුළ එතරම් ජනප්‍රිය වූ බවක් නො පෙනේ. හුදු දර්ශනයට පමණක් සීමා නොවූ ශ්‍රී ලාංකික ජනතාව ඇතින් ඇති දේත් මැතින් ඇති දේත් වස්තු වශයෙන් ප්‍රමාණයේ වෙනසක් නොවන බව තේරුම් ගත්හ. අනෙක ඒ සියල්ල පිහිටියේ සම මට්ටමක ය. ඒවා ඉහළින් පිහිටා ඇත්තේ කඳුවල පමණි. ඒ සත්‍යය මැනවින් අවබෝධ කරගත් කලාකරුවා එක් සමාන පාදයක් මත සියලු වස්තූන් හා මානව රූ සිත්තම් කළේ සෑම දෙයක් පිළිබඳව ම යථාභූතඥානීය දර්ශනයකින් ශික්ෂිත ශ්‍රී ලාංකික ජනතාවට එය සුදුසු ම ආකාරය විය. දෘෂ්ටි මායාව ඔවුහු හොඳින් තේරුම් ගත්හ.

i. ඡේදයට අනුව ස්වාභාවික පරිමාණය එලෙසින්ම යෙදූ සම්ප්‍රදාය කුමක්ද?

ii. පෙරදිග සම්ප්‍රදාය භාවිතා කළ පරිමාණයේ නම කුමක්ද?

papers.lk

iii. මහනුවර චිත්‍ර සම්ප්‍රදායේ ඇති දුර්වල ලක්ෂණය කුමක්ද?

iv. යුරෝපීය ක්‍රමයේ චිත්‍ර සම්ප්‍රදායන් ඇති විහාරස්ථාන දෙකක් නම් කරන්න.

v. ඡේදයට අනුව චිත්‍ර නැරඹීම පිළිබඳව ශ්‍රී ලාංකීය ජනතාව සතු දක්ෂතා දෙකක් ලියන්න. **(ලකුණු 10යි)**

(05) ඔබ ජීවත් වන ගම් ප්‍රදේශය අග්‍ර පානීය ජල හිඟයකට පත් ව ඇතැයි සිතන්න. පවුල් 85ක් පමණ ජීවත් වන මෙම ගම් ප්‍රදේශයේ ළිං ජලය පානයට නුසුදුසු බව පරීක්ෂණ මගින් හෙළි වී ඇත. සැතපුම් දෙකක පමණ දුරක් ගෙවා ගොස් ප්‍රදේශවාසී ජනතාව පානීය ජලය සපයා ගනිති. ඇතැම්හු පවතින ජලය පානය කිරීමෙන් විවිධ ලෙඩ රෝගවලට ගොදුරු ව සිටිති. ඉහත කරුණු පිළිබඳව ද සලකා පානීය ජලය ලබා දෙන ලෙස ඉල්ලා ප්‍රදේශයේ ජල සම්පාදන මණ්ඩලයේ ලේකම් වෙත යවන ලිපිය ලියන්න. ඔබ, ප්‍රදේශයේ ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් සමන් ඉලංගසිංහ යයි සිතන්න. (වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)

**<u>නැතහොත්</u>**

ඔබ විදුහලේ පවත්වන්නට නියමිත නිවාසාන්තර මලල ක්‍රීඩා උළෙල වර්ණවත් කිරීමට ආරාධිත අමුත්තන්ට ඇරයුම් කිරීමට සුදුසු ආරාධනා පත්‍රයක් සකස් කරන්න. ප්‍රධාන අරාධිත අමුත්තන් වශයෙන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා, ප්‍රදේශය භාර පොලිස් ස්ථානාධිපති සහභාගි වීමට නියමිත ය. (වචන 100ක් පමණ ප්‍රමාණවත්ය.) **(ලකුණු 15යි)**

papers.lk

Remove Watermark Now
papers.lk
pdfelement

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Department of Education, Southern Province**

**21 S III**

**දෙවන වාර පරීක්ෂණය, 2018 ජූලි**
**Second Term Test, July 2018**

**10 ශ්‍රේණිය**
**Grade 10**

**සිංහල භාෂාව හා සාහිත්‍ය - III**
**Sinhala language and literature**

**පැය දෙකයි**
**Two hours**

**(01). (1) සිට (10) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

i. "මිනිසුන් හිර ගෙදර උන්න හිටිය හැටියෙ මුල්ලකට ගිහින් වැටෙනවා. මැරෙනවා"
   (අ) ඉහත සඳහන් ප්‍රකාශය කළේ කවුරුන් ද?
   (ආ) මෙම ප්‍රකාශය උපුටාගත් ග්‍රන්ථය කුමක්ද?

ii. කන්කලු වෙණ නද ඇසුමෙහි ලොබිනේ
රන් රසු දූල කොලහල වන බියෙනේ
සන්සල නොව එහි පිළි රූ ලෙසිනේ
..............................................................................
   (අ) මෙහි ඉතිරි පදය සම්පූර්ණ කරන්න.
   (ආ) මෙහි සඳහන් උපමාව ලියන්න.

iii. "මේ කෙසේ වූ තැනක ඇති වී දැ?"
   (අ) "කෙසේ වූ තැනක ඇති වී දැ, යි මෙහි විමසන්නේ කුමක් පිළිබඳව ද?
   (ආ) ඉහත උද්ධෘතය ඇතුළත් කෘතිය ලියැවුණේ කුමන සාහිත්‍ය යුගයක ද?

iv. (අ) පරමත්ථ ජෝතිකාව රචනා කළ සාහිත්‍ය යුගය නම් කරන්න.
   (ආ) හානා හීය පානා අඬහැරෙන් දූනේ පාඩමට අදාළ පද්‍ය කුමන ජනකවි ගණයට අයත් ද ?

v. (අ) ගුත්තිල කාව්‍යය රචනා වූයේ කුමන රජ දවස ද?
   (ආ) එය රචනා කරන ලෙස ආරාධනය කරනු ලැබුයේ කවුරුන් ද?

vi. (අ) 'විලේජ් ඉන් ද ජංගල්' කෘතියේ කතුවරයා නම් කරන්න.
   (ආ) එය සිංහලයට අනුවර්තනය කරනු ලැබුයේ කවුරුන් විසින් ද?

vii. "ඉදින් නුඹ වහන්සේ අමුත්තක් දන්නා සේක් වී නම් පසිඳුව මැනව."
   (අ) ඉහත ප්‍රකාශය කළේ කවුරුන් ද?
   (ආ) මෙහි නුඹ වහන්සේ යන ඇමතුම ලැබුයේ කවුද?

viii. රන් විමනේ සිටි මුත් දුක නැති වෙද්ද
පැණි මීයේ කෑ මුත් දුක නැති වෙද්ද
මිණි බරණින් සැදු මුත් ගත නො දිරද්ද
..............................................................................
   (අ) ඉහත පද්‍යයේ ඉතිරි පදය සම්පූර්ණ කරන්න.
   (ආ) "මිණි බරණින්" යන්නෙහි අර්ථය ලියන්න.

ix. "මේ පණ්ඩිතයෝ මට මිණි රුවනක් ගෙනා වන්නාහ"

(අ) ඉහත සිතුවිල්ල කාගේ ද?

(ආ) මෙහි සඳහන් වන මිණි රුවන කුමක්ද?

x. සතොස් කරන වීණා නද ඇසුමට
නොගොස් සිටින පිල්බර ගණ ගොදුරට
වෙසෙස් රුවින් තම මැව්වත් බඹහට
සඳැස් සවන් නොකළැයි වූ නොසතුට

(අ) පිල්බර ගණ ගොදුරට නො ගොස් සිටියේ ඇයි?

(ආ) සඳැස් යන්නෙහි අර්ථය ලියන්න.

(ලකුණු 2 x 10 = 20යි)

**(02) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.**

i. "මහා බෝධිසත්ත්වයන්ගේ දිගන්තරයෙහි පතළා වූ තේජස් පරිද්දෙන් පහරන්නා වූ හිරු රැසින් ඩා වැහෙන්නා වූ ශරීර ඇති වූහ."

(අ) මේ පාඨයෙහි සඳහන් උපමාවක් ලියන්න.

(ආ) මේ පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

ii. රැති වන්පෙතිනැව්දින් **සුමුවෝයා**
නිති මියුරැති වෙණ නද **ළමුවෝයා**
සිතිවිලි නැති රූ විලස **මුවෝයා**
තැති නොගනිති මිනිසුන් **සමුවෝයා**

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

(ආ) අවසන් කවි පද දෙකෙහි අර්ථය සරල බසින් ලියන්න.

iii. "දත් නැති කට ඇතුළට වැදුණු දෙතොල නාසයට යටින් පෙනුණේ කෙළවලින් තෙමුණු රේඛාවක් ලෙසිනි."

(අ) ඉහත උද්ධෘතයෙන් විස්තර කෙරෙන්නේ කවුරුන් පිළිබඳව ද?

(ආ) මෙහි සඳහන් උපමාව උපුටා ලියන්න.

iv. ගොඩැල්ලේ තරම දැනගෙන ළිඳ **කපනු**
බොරැල්ලේ තරම දැනගෙන උඩ **පනිනු**
කඩුල්ලේ තරම දැනගෙන කඳ **බඳිනු**
තමුන්ගේ තරම දැනගෙන කල් **හරිනු**

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

(ආ) ඉහත පද්‍යයට ගැළපෙන ආප්තෝපදේශය ලියන්න.

v. "උනට මා පිටිවහල් වුව මැනවැ, යි සිතා තමන් වහන්සේ හා එක දවස උපන් යෝධයන් දහස බණවා...."

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය සරල බසින් ලියන්න.

(ආ) මේ පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(ලකුණු 4 x 5 = 20යි)

(03) ගුත්තිල කවියාගේ අද්විතීය කවිත්වය ඉස්මතු වන්නේ,

i. අවස්ථාවට ගැළපෙන පරිදි බස හැසිරවීමට කවියා පෑ දක්ෂතාවයි.

ii. ගුත්තිල හා මූසිල චරිතවල ස්වභාවය දැක්වීමෙනි. වෙණ මිහිර පැදි පෙළෙන් නිදසුන් දෙක බැගින් දක්වමින් විමසන්න.

<u>නැතහොත්</u>

බැද්දේගම නවකතාව පාඨක සිත්සතන් දිනා ගනුයේ,

i. කතුවරයා බැද්දේගම ගමෙහි ස්වභාවය සැබෑ ලෙස දැකීමත්,

ii. පාඨක හදවත් තුළ පුංචි මැණිකා කෙරේ ඇතිවන දයාවත් නිසාය. නිර්දිෂ්ට කොටස ඇසුරින් නිදසුන් දෙක බැගින් දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු - 15)

(04) i. අවස්ථා හා සිද්ධි නිරූපණයේදීත්,

ii. විවිධ රස ජනනය කිරීමේදීත්,

ජාතක කථාකරු දක්වන්නේ අපූර්ව කුසලතාවකි. සතර කන් මන්ත්‍රණය පාඩම ඇසුරින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.

**නැතහොත්**

උපදේශාත්මක ජනකවිය

i. ඕනෑම කාලයකට උචිත(සර්වකාලීන) සාහිත්‍යාංගයකි.

ii. සරල ව අවබෝධ කරගත හැකි සාහිත්‍යාංගයකි.

එක් කරුණකට නිදසුන් දෙක බැගින් දක්වමින් විමසන්න. (ලකුණු - 15)

(05) ගැමි පරිසරයේ උකහාගත් නිදසුන් ඇසුරෙන් සමාජය සුමඟට යොමු කිරීමට ජනකවියා දරා ඇති උත්සාහය 'හානා හීය පානා අඬහැරෙන් දනේ' පැදි පෙළ තුළින් ඉස්මතු වේ. නිදසුන් තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු - 10)

(06) බුද්ධිමත් ව කටයුතු කිරීමෙන් තමා වෙත පැමිණෙන අභියෝගවලට පහසුවෙන් මුහුණ දිය හැකි බව සතර කන් මන්ත්‍රණය පාඩමෙන් පසක් වේ. සුදුසු නිදසුන් තුනක්වත් දක්වමින් විමසන්න. (ලකුණු - 10)

(07) ගුත්තිල පඬිතුමාගේ උසස් ගුණාංගයත් මූසිල චරිතයේ දුර්වලතාත් වෙණ මිහිර පද්‍ය පන්තියෙන් කියැවේ. නිදසුන් තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු - 10)

papers.lk
pdfelement
Remove Watermark Now

Remove Watermark Now
papers.lk
pdfelement